මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PF/R/3/Security
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2010.08. 12

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 445

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් ,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය බැංකු සභාපතිවරුන්.

**අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු සහ රජයේ සමාගම් රාජ්‍ය සංස්ථා සඳහා ආරක්ෂක සේවා ලබා ගැනීම**

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන් සඳහා වෘත්තීය නිපුණතාවයෙන් සහ විනයානුකූල හැසිරීමෙන් යුත් කාර්යක්ෂම ආරක්ෂක සේවාවක් සැපයීමේ අවශ්‍යතාවය කෙරෙහි රජයේ අවධානය යොමු වී ඇත. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම සහ සී/ස එල්.ආර්.ඩී.සී. සේවා (පුද්ගලික) සමාගම යන රාජ්‍ය / අර්ධ රාජ්‍ය සමාගම් විසින් සමහර රාජ්‍ය ආයතන වල ආරක්ෂක සේවා දැනටමත් ඉටුකරනු ලැබේ.

(2) ආරක්ෂක සේවාවන් සපයන රජය සතු සමාගම් සතුව ආරක්ෂක ක්ෂේත්‍රයෙහි මනා පළපුරුද්දක් සහිත කාර්ය මණ්ඩලයක් සිටින බැවින්, පෞද්ගලික ආරක්ෂක සේවාවන්ගේ සේවය බලාපොරොත්තු වන සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සංස්ථා සහ බැංකු විසින් එම සේවා ලබා ගැනීමට පෙර / දැනට ඇති සේවා ගිවිසුම් නැවත අළුත් කිරීමට පෙර රජය සතු ආරක්ෂක සේවා සපයන සමාගම්වලින් එම සේවා සපයා ගත හැකිද යන්න පිළිබඳව පූර්ව විමසීමක් කර තීරණයක් ගත යුතු බවට රජය තීරණය කර ඇත.

(3) එබැවින්, ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ආරක්ෂක සේවා අවශ්‍යතාවයන් සපයා ගැනීමේදී ඉහත සඳහන් සමාගම්වලින් පූර්ව විමසීමක් කිරීමෙන් පසුව පමණක් වෙනත් ආයතනවලින් සේවා ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. තවද පෞද්ගලික ආරක්ෂක සේවාවන් තෝරා ගැනීමේදී එම සේවාවන්වල ප්‍රමිතීන් හා මිල ගණන් පිළිබඳව ද අවධානය යොමු විය යුතු බව දන්වමි.

පී.බී. ජයසුන්දර,
භාණ්ඩාගාරයේ ලේකම්.

පිටපත:විගණකාධිපති.